19 AUG

# Non-Academic Vacancies (Open Recruitments) – University of Sri Jayewardenepura

19TH AUGUST 2026 / VACANCIES

## පුරප්පාඩු

## ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය

මෙම විශ්වවිද්‍යාලයේ පහත සඳහන් තනතුරු සඳහා සුදුසුකම් සපුරා ඇති අයදුම්කරුවන්ගෙන් **2026.08.19** දින පෙ.ව. **8.30** සිට **2026.09.02** දින ප.ව. **4.00** දක්වා අයදුම්පත් කැඳවනු ලැබේ.

### යාන්ත්‍රික ශිල්පී (III ශ්‍රේණිය)/ වැද්දුම්කරු (III ශ්‍රේණිය)
### MACHINIST (GRADE III)/ FITTER (GRADE III)

**සුදුසුකම් :**

1. තනතුරේ කාර්යයට අදාළ තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගත් කාර්මික / වෘත්තීය පුහුණු ආයතනයක් විසින් නිකුත් කරන ලද ජාතික වෘත්තීය සුදුසුකම් (NVQ) 4 වන මට්ටමට නොඅඩු ප්‍රවීණතා සහතිකයක් ලබා තිබීම.

**සටහන :-** පාඨමාලාවට අදාළ ජාතික වෘත්තීය සුදුසුකම් මට්ටම (NVQ Level) තහවුරු කිරීම සඳහා තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව (Tertiary and Vocational Education Commission) මඟින් නිකුත් කරන සමානතා සහතිකයක් (Certificate of Equivalence) ඉදිරිපත් කළ යුතුය.

**වෙනත්:**

1. ශ්‍රී ලාංකික පුරවැසියෙකු විය යුතුය.
2. තනතුරේ රාජකාරි හොඳින් ඉටු කිරීමට සහ දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමට ශාරීරිකව හා මානසිකව සුදුසු විය යුතුය.
3. මනා චරිතවත් පුද්ගලයෙකු විය යුතුය.

**වැටුප් පරිමාණය :-** රු. **48,005 – 16x490 – 55,845** (මාසික) **U-PL 3(III)**

(මෙයට අමතරව රජය විසින් අනුමත කරන ලද දීමනා ගෙවනු ලැබේ.)

**බඳවා ගැනීම :-** වෘත්තීය පරීක්ෂණයක් හා ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් මඟින්.

**වයස :–** අවුරුදු 18 ට නොඅඩු සහ අවුරුදු 45 ට නොවැඩි විය යුතුය.

### ආරක්ෂක නියාමක (III ශ්‍රේණිය) / ක්‍රීඩාපිටි නඩත්තු සේවක (III ශ්‍රේණිය)
### SECURITY GUARD (GRADE III)/ GROUNDSMAN (GRADE III)

**සුදුසුකම් :**

1. අ.පො.ස. (සා.පෙළ) විභාගය විෂයයන් හයක් (06) අවමය සම්මාන සාමාර්ථ දෙකක් (02) සහිතව උපරිම වාර දෙකක දී සමත් වී තිබීම.

**වෙනත් :**

1. ශ්‍රී ලාංකික පුරවැසියෙකු විය යුතුය.
2. තනතුරේ රාජකාරි හොඳින් ඉටු කිරීමට සහ දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමට ශාරීරිකව හා මානසිකව සුදුසු විය යුතුය.
3. මනා චරිතවත් පුද්ගලයෙකු විය යුතුය.

**වැටුප් :-** රු. **42,775-16x450 – 49,975** (මාසික) **U-PL 1(III)**

**බඳවා ගැනීම :–** වෘත්තීය පරීක්ෂණයක් හා/හෝ ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් මඟින්.

**වයස :–** අවුරුදු 18 ට නොඅඩු සහ අවුරුදු 45 ට නොවැඩි විය යුතුය.

### මරණ පරීක්ෂක කම්කරු (III ශ්‍රේණිය)/ සෞඛ්‍ය සේවා කම්කරු (III ශ්‍රේණිය)
### POSTMORTEM LABOURER (GRADE III)/ HEALTH SERVICE LABOURER (GRADE III)

**සුදුසුකම් :**

1. අ.පො.ස. (සා.පෙළ) විභාගයට පෙනී සිට තිබිය යුතුය.

**වෙනත්:**

1. ශ්‍රී ලාංකික පුරවැසියෙකු විය යුතුය.
2. තනතුරේ රාජකාරි හොඳින් ඉටු කිරීමට සහ දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමට ශාරීරිකව හා මානසිකව සුදුසු විය යුතුය.
3. මනා චරිතවත් පුද්ගලයෙකු විය යුතුය.

**වැටුප් :-** රු. **42,775-16x450 – 49,975** (මාසික) **U-PL 1(III)**

**බඳවා ගැනීම :–** වෘත්තීය පරීක්ෂණයක් හා/හෝ ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් මඟින්.

**වයස :–** අවුරුදු 18 ට නොඅඩු සහ අවුරුදු 45 ට නොවැඩි විය යුතුය.

අයදුම්කරුවන් තම ඉපයීම් වලින් 10% ක් විශ්වවිද්‍යාල අර්ථසාධක අරමුදලට ගෙවිය යුතු අතර, විශ්වවිද්‍යාලය මඟින් එකී ඉපයීම් වලින් 7%කට සමාන මුදලක් විශ්වවිද්‍යාලයීය අර්ථසාධක අරමුදලට හා 8% කට සමාන මුදලක් විශ්වවිද්‍යාලයීය විශ්‍රාම වැටුප් අරමුදලට බැර කරනු ලැබේ. එයට අමතරව 3%ක මුදලක් විශ්වවිද්‍යාලය මඟින් සේවා නියුක්තයන්ගේ භාරකාර අරමුදලට බැර කරනු ලැබේ.

අයදුම්පත් මාර්ග ගත ක්‍රමවේදය මඟින් පමණක් ඉදිරිපත් කළ යුතු අතර අයදුම්පත් ඉදිරිපත් කිරීම සඳහා මාර්ගගත ද්වාරය (Online Portal) 2026.08.19 දින පෙ.ව. 8.30 සිට 2026.09.02 දින ප.ව. 4.00 දක්වා විවෘතව පවතිනු ඇත. වැඩි විස්තර https://www.sjp.ac.lk/vacancies වෙබ් පිටුව මඟින් ලබා ගත හැකි අතර මාර්ග ගත ක්‍රමවේදය ඔස්සේ අයදුම්පත් ඉදිරිපත් කිරීම සඳහා https://hrms.sjp.ac.lk/vacancies/nonacademic/open වෙත පිවිසිය යුතුය.

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව/විශ්වවිද්‍යාලයක/උසස් අධ්‍යාපන ආයතනයක/රාජ්‍ය දෙපාර්තමේන්තුවක/රාජ්‍ය සංස්ථාවක/ව්‍යවස්ථාපිත මණ්ඩලයක සේවය කරන අයදුම්කරුවන් අයදුම් කරන ලද තනතුරට තේරී පත්වුවහොත් තමා සේවය කරන ආයතනයේ සේවයෙන් නිදහස් කළ හැකි බවට වූ තම ආයතනයේ ප්‍රධානී සහතිකය අයදුම්පත් ඉදිරිපත් කරන අවස්ථාවේ උඩුගත (Upload) කළ යුතුය.

සෑම අයදුම්කරුවෙකුම තමා විසින් අයදුම් කරනු ලබන සෑම තනතුරක් සඳහාම වෙන් වෙන් වශයෙන් ආපසු නොගෙවන පදනම මත **රු. 1000.00** ක අයදුම්පත් ගාස්තුවක් ගෙවිය යුතුය. ඔබට මෙම ගෙවීම මාර්ගගත ක්‍රමවේදය (online) ඔස්සේ ණයපත්/හරපත් (Credit/Debit Card) මගින් සෘජුවම කළ හැකිය.

ඔබ මෙම ගෙවීම මහජන බැංකු ශාඛාවක් මඟින් සිදු කරන්නේ නම් අයදුම්පත අවසානයේ දක්වා ඇති පරිදි බැංකු පෝරමය (Bank Slip) පුරවා භාර දෙන්න. **පෝරමයේ ඇති හේතුව (Purpose) ලෙස අයදුම් පතට අදාල අනන්‍ය ගෙවීම් යොමු අංකය (Payment Reference No.) සටහන් කිරීම අනිවාර්ය වේ.** එම බැංකු පෝරමය උඩුගත (Upload) කළ යුතු අතර, ඒ සඳහා පහසුකම් සලසා ඇත.

මෙම ගෙවීම මාර්ගගත බැංකු හර කිරීම් (Bank Transfer) හරහා සිදුකිරීම **නොකළ** යුතු බව කරුණාවෙන් සලකන්න.

අයදුම්පතට අදාල අනන්‍ය (Unique) ගෙවීම් අංකය (Payment Reference No.) සඳහන් කර **නොමැති** බැංකු පෝරම උඩුගත (Upload) කර තිබීම, නියමිත අයදුම්පත් ගාස්තුව ගෙවා නොතිබීම, අවශ්‍ය විස්තර සඳහන් නොකිරීම, අපැහැදිලිවීම, සුදුසුකම් සහ පලපුරුද්ද සනාථ කිරීම සඳහා අදාල සහතික වල පිටපත් උඩුගත (Upload) කර නොතිබීම හෝ වෙනයම් අවශ්‍යතාවයක් සපුරා නොතිබීම අයදුම්පත් ප්‍රතික්ෂේප කිරීමට හේතු වේ.

කිසියම් අයදුම්පත්‍රයක් ප්‍රතික්ෂේප කළ විට කුමන හේතුවක් නිසා හෝ යළි සලකා බැලීම සිදු නොකෙරේ.

විමසීම් සඳහා රාජකාරි දිනවල පෙ.ව. 08.30 සිට ප.ව. 4.00 දක්වා 0112758212/102 දුරකථන අංක ඔස්සේ ඇමතිය හැක.

**ලේඛකාධිකාරී**
ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය,
ගංගොඩවිල, නුගේගොඩ.
2026.06.19